සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## පෙරදිග සංගීතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I කොටස

- ප්‍රශ්න සියල්ලටම පළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෙරදිග සංගීතයේ ස්වර කීපයක් ආරෝහණ ක්‍රමයට නිවැරදිව ලියා ඇති පිළිතුර වන්නේ,
    I. ම ග රි ස　　II. ස රි ග ම
    III. ස ම ග රි　　IV. ස රි ම ග

02. සුළඟේ ආධාරයෙන් හඬ නිපදවන වාද්‍ය භාණ්ඩයකි.
    I. බටනලාව.　　II. වයලීනය
    III. තබ්ලාව　　IV. ගිටාරය

03. පෙරදිග ක්‍රමයට අනුව ග ස්වරය සහ ධ ස්වරය පිළිවෙලින් නම් කර ඇති පිළිතුර කුමක්ද?
    I. මධ්‍යමය, ගාන්ධාරය　　II. ගාන්ධාරය, පංචමය
    III. ගාන්ධාරය, ධෛවතය　　IV. ධෛවතය, ගාන්ධාරය

04. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් වනුයේ,
    I. ලංකා ලංකා පෙම්බර ලංකා ය.　　II. මිහිකත නලවාලා ය.
    III. කඳුපෙල අතරේ ය.　　IV. හෙළ ජාතික අභිමානේ ය.

05. ශ්‍රී ලංකා ජාතික ගීතයේ නිර්මාතෘවරයා වන්නේ,
    I. සුනිල් ශාන්ත මහතා ය.　　II. ලයනල් අල්ගම මහතා ය.
    III. රෝහණ බැද්දගේ මහතා ය.　　IV. ආනන්ද සමරකෝන් මහතා ය.

06. අංක 6 සිට 10 දක්වා පිළිතුරු සැපයීමේ දී පහත වගුව උපයෝගී කරගන්න. ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 6. ස්වර ස්ථාපන ගීතයකි. | මෙම ගිම්හාන |
| 7. නූර්ති ගීතයකි. | අහසට පිඹිනා |
| 8. ළමා ගීතයකි. | බැතිනා සිරිපා |
| 9. කළගෙඩි සෙල්ලමෙහි එන ගීතයකි. | මේ වැල මොකදෝ |
| 10. එළුවන් කෑමේ එන ගීතයකි. | සෙන්පතියන් ගැන |

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

11. විශිෂ්ට ලෙස ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා ස්වර අභ්‍යාස ගායනය ඉතා වැදගත් වේ. (　　)
12. සංගීතයේ මාධ්‍යය භාෂාව වේ. (　　)
13. වයලීනය, අළුවක ආධාරයෙන් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයකි. (　　)
14. පාසල් ගීතය ගායනය තුළින් පාසල පිළිබඳ අභිමානයක් අප සිත්වල ජනිත වේ. (　　)
15. චිත්‍ර, නැටුම්, සංගීත වැනි විෂයන් ඉගෙනීම මගින් මානසික සුවයක් ලැබේ. (　　)

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාලව දී ඇති ප්‍රකාශවල හිස්තැනට ගැලපෙන නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න.

(ගිටාරය, භාරතදේශයට, තබ්ලාව, ගමප, පධනි, ඉරෙන් හඳෙන්, GAB)

16. බටහිර සංගීත ස්වර පිලිවෙලින් ලිවීමේ දී C,D,E,F ..................................... වේ.

17. හින්දුස්ථානි සංගීත පද්ධතිය අයත් වන්නේ ..................................... ය.

18. සරිග, රිගම, යන ස්වර අභ්‍යාසයේ ඊලඟ පියවර වන්නේ ..................................... යන ස්වර ඛණ්ඩය යි.

19. සරල සංගීතයේ දී බොහෝවිට උපයෝගී කරගන්නා ස්වර වාද්‍ය භාණ්ඩයක් ලෙස ..................................... හැඳින්විය හැකිය.

20. ..................................... ප්‍රචලිත ළමා ගීතයකි. (ලකුණු 1x20)

---

II කොටස

- පහත සඳහන් ප්‍රශ්න අතරින් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. I පෙරදිග ක්‍රමයට ස්වර සප්තකය ආරෝහණ සහ අවරෝහණ පිළිවෙලට ලියා දක්වන්න. (ල 6)

II බටහිර ක්‍රමයට ගායනා කිරීමේදී ස්වර සප්තකය සටහන් කරන ආකාරය ලියා දක්වන්න. (ල 4)

02. I නිර්දේශිත ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල 10)

03. I රටක ජාතික ගීතයෙන් පිළිඹිබුවන කරුණු 4ක් ලියන්න. (ල 4)

II ජාතික ගීතයේ මුල්කොටස ලියා දක්වන්න. (ල 6)

04. I කෙළි ගී වර්ග හතරක් නම් කරන්න. (ල 4)

II ඉහත ඔබ නම්කල කෙළි ගී වර්ග අතරින් කැමති එක් ගීතයක් නම් කර ලියා දක්වන්න. (ල 4)

III කෙළි ගී ගායනා කරන අවස්ථා 2ක් නම් කරන්න. (ල 2)

05. I ස්වර පුවරුවක රූප සටහනක් ඇද එහි ශුද්ධ ස්වර ස්තකය සටහන් කරන්න. (ල 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 06 - 2024

# පෙරදිග සංගීතය (ප්‍රායෝගික පරීක්ෂණය)

නම / විභාග අංකය:

01. ශුද්ධ ස්වර සප්තකය ආරෝහණ සහ අවරෝහණ පිළිවෙලට ගායනා කරන්න. (ලකුණු 10)

02. ඔබ දන්නා ළමා ගීතයක් ගායනා කරන්න. (ලකුණු 10)

03. ශ්‍රී ලංකා ජාතික ගීතය සම්පූර්ණයෙන් ගායනා කරන්න. (ලකුණු 10)

04. ඔබ දන්නා කෙළි ගීතයක් ගායනා කරන්න. (ලකුණු 10)

05. ඔබ කැමති සංගීත භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය කරන්න. (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## පෙරදිග සංගීතය (පිළිතුරු පත්‍රය)

I කොටස

| | | | |
|---|---|---|---|
| 01. II | 06. බැතිනා සිරිපා | 11. √ | 16. GAB |
| 02. I | 07. මෙම ගිම්හාන | 12. X | 17. භාරත දේශයට |
| 03. III | 08. සෙන්පතියන් ගැන | 13. √ | 18. ගමප |
| 04. III | 09. අහසට පිඹිනා | 14. √ | 19. ගිටාරය |
| 05. IV | 10. මේ වැල මොකදෝ | 15. √ | 20. ඉරෙන් හඳෙන් |

II කොටස

01. I ස්වර නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල 6)

II DO Re mi Fa So La ti. (ඩෝ, රේ, මි, ෆා, සෝ, ලා, ටි ක්‍රම 2 කටම ලකුණු ලබා දෙන්න) (ල 4)

02. I නිර්දේශිත ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල 10)

03. I කරුණු හතරක් ලියා ඇත්නම් ලකුණු හතරක් හිමි වේ. (ල 4)

II ජාතික ගීතයේ මුල් කොටස නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල 6)

04. I කෙළි ගී වර්ග හතරක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල 4)

II කැමති කෙළි ගීයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල 4)

III අවස්ථා 2කට ලකුණු 2ක් ලබා දෙන්න. (ල 2)

05. I නිවැරදි ලෙස ඇඳ ස්වර සප්තකය ලකුණු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල 10)